# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2113/59 - 2019 මාර්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2019.03.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

32 සහ 33 වගන්ති යටතේ නියෝග

විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍ය හරීන් ප්‍රනාන්දු වන මම 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 (ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව මේසපන්දු (ටේබල් ටෙනිස්) ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා මේසපන්දු (ටේබල් ටෙනිස්) සංගමයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර තාවකාලික වැඩපිළිවෙලක් වශයෙන් එකී සංගමයේ කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් අතුරු පාලක කමිටුව පත් කරමි.

| | | | |
|---|---|---|---|
| 1. | ගාල්ල ලියනගේ සජිත් ජයලාල් මහතා | - | සභාපති |
| 2. | වෛද්‍ය ධම්මික සේනානායක මහතා | - | ලේකම් |
| 3. | කාරියවසම් දෙවරාකෝට්ටගේ අයන්ති ශාලිකා කාරියවසම් මහත්මිය | - | භාණ්ඩාගාරික |

තවද, ශ්‍රී ලංකා මේසපන්දු (ටේබල් ටෙනිස්) සංගමයේ නිළවරණය පැවැත්වීම සඳහා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ සංශෝධිත රෙගුලාසි අනුව එම සම්මේලනයෙහි විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා එමගින් නිළවරණ කමිටුවක් පත් කිරීම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මගින් සිදු කිරීමටත් නිළවරණ කමිටුව මගින් නිළවරණය කැඳවීම හා පැවැත්වීම අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමටත් බලය පවරමි.

හරීන් ප්‍රනාන්දු,
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය.

2019 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

03 - 1021/1


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

32 සහ 33 වගන්ති යටතේ නියෝග

විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍ය හරීන් ප්‍රනාන්දු වන මා 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ අංක 32 (ආ) සහ 33 වගන්ති අනුව මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය සහ ශ්‍රී ලංකා සවි එසවීමේ (පවර් ලිෆ්ටින්) සම්මේලනයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවනු ලබන අතර තාවකාලික කාර්ය ක්‍රමයක් වශයෙන් එකී සම්මේලනයන්හි කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් අතුරු පාලක කමිටු පත් කරමි.

ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය සඳහා පත් කරනු ලබන අතුරු පාලක කමිටුව

1. මහේෂ් ගම්මන්පිල මහතා - සභාපති
2. ශිරෝමි රණවක මහත්මිය - ලේකම්
3. පී. බී. ජයතිලක මහතා - භාණ්ඩාගාරික

ශ්‍රී ලංකා සවි එසවීමේ සම්මේලනය සඳහා පත් කරනු ලබන අතුරුපාලක කමිටුව

01. වෛද්‍ය ලාල් ඒකනායක මහතා - සභාපති
02. ලක්මිණී සමරසිංහ මහත්මිය - ලේකම්
03. රවීන්ද්‍ර කුමාර මහතා - භාණ්ඩාගාරික

තවද, ශ්‍රී ලංකා කායවර්ධන, ශාරීරික යෝග්‍යතා සම්මේලනය සහ ශ්‍රී ලංකා සවි එසවීමේ සම්මේලනයන්හි නිලවරණය පැවැත්වීම සඳහා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ සංශෝධිත රෙගුලාසි අනුව එම සම්මේලනයන්හි විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා එමගින් නිලවරණ කමිටුවක් පත් කිරීම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මගින් සිදු කිරීමටත් නිලවරණ කමිටුව මගින් නිලවරණය කැඳවීම හා පැවැත්වීම අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමටත් බලය පවරමි.

හරීන් ප්‍රනාන්දු,
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය.

2019 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

03 - 1021/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.